# මානවශාස්ත්‍ර පරිකල්පනයෙන් නව මානයන් වෙත

## මානවශාස්ත්‍ර පීඨ ජාත්‍යන්තර පරිසංවාදය

## 2025 නොවැම්බර් 27 සහ 28

21වන සියවස වන විට මානවශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රය එයට ම අනන්‍ය වූ අභියෝගාත්මක ප්‍රස්තාවන්ට මුහුණ දෙමින් සිටියි. මානවශාස්ත්‍ර විෂයයන් එකී අභියෝගවලට අනුවර්තනය වෙමින් සංවර්ධනය වන්නේ කෙසේ ද? යන්න ගවේෂණය කිරීම මෙම පරිසංවාදයේ අභිමතාර්ථය යි. ඒ අනුව මානවශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රයේ වටිනාකම් හඳුනාගනිමින් වෙනස් වෙමින් පවතින වත්මන් සමාජය වෙත එහි බලපෑම අවබෝධ කර දීම අපගේ උත්සාහය වන්නේ ය. එම අධ්‍යාශය පෙරදැරි ව මානවශාස්ත්‍රීය නව්‍ය ප්‍රවේශ සහ නව්‍ය දෘෂ්ටිකෝණ පිළිබඳ ශාස්ත්‍රීය පරිසංවාදයකට විද්වත් ඔබට ඇරයුම් කර සිටිමු.

**පරිසංවාද මාතෘකා**

**1. සංස්කෘතික වටිනාකම් සහ සංස්කෘතික අනන්‍යතාව**

මෙම තේමාව යටතේ මානවශාස්ත්‍රීය විෂයයන්හි සංස්කෘතික වටිනාකම්, එහි අනන්‍යතාව, උරුමය සහ විවිධත්වය හඳුනාගනිමින්, එකී ලක්ෂණ 21වන සියවසේ අභියෝගවලට මුහුණ දෙමින් ප්‍රකාශනය, රක්ෂණය සහ පරිණාමයට බඳුන් වීමේ ස්වභාවය අධ්‍යයනය කෙරේ.

**2. මානවශාස්ත්‍රයන්හි අධ්‍යාපනික වටිනාකම**

මෙම ප්‍රස්තුතය මගින් විචාරාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය සහ සහකම්පනය පෝෂණයෙහි ලා මානවශාස්ත්‍ර විෂයයන්වල ඇති අධ්‍යාපනික කාර්යභාරය අරමුණු කෙරේ. මේ යටතේ වර්තමානයේ භාවිත නව ඉගෙනුම් ක්‍රමවේද සහ මානවශාස්ත්‍රීය අධ්‍යාපනයෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙත සිදු කෙරෙන බලපෑම අධ්‍යයනය කිරීම අපේක්ෂිත ය.

**3. අන්තර් විෂය ප්‍රවේශය පෝෂණය කිරීම**

මෙමගින් මානවශාස්ත්‍රීය විෂයයන් සහ සෙසු විෂය ක්ෂේත්‍ර අතර සහයෝගිතාවේ වැදගත්කම ඉස්මතු කෙරෙන අතර බහුවිධ දෘෂ්ටිකෝණ මගින් නව සංකල්පීය දැනුම් පෝෂණය කෙරෙහි ඇති ශක්‍යතාව පිළිබඳ අවධානය යොමු කෙරේ.

**4. මානවශාස්ත්‍ර පර්යේෂණවල නව මාන**

ඩිජිටල්කරණයට අනුගතවෙමින් ගෝලීයකරණය වූ ලෝකයේ, උසස් අධ්‍යාපනය හා බැඳුණු විවිධ පර්යේෂණ විෂය පථ අතරින් මානවශාස්ත්‍ර පර්යේෂණ නව දෘෂ්ටියකින් මෙහෙයවීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**5. සංහිඳියාව සඳහා මානවශාස්ත්‍ර විෂයන්හි කාර්යභාරය**

සංස්කෘතික, සමාජීය සහ දේශපාලනික බෙදීම් පිළිබඳ මනාකොට අවබෝධ කරගනිමින් ඒවා සමනය කර සංහිඳියාව පෝෂණය සඳහා මානවශාස්ත්‍ර විෂයයන්හි දායකත්වය මෙමගින් ගවේෂණය කෙරෙනු ඇත. ඒ යටතේ අතීත ස්මෘති, ඓතිහාසික ආඛ්‍යාන සහ යුක්තිය ප්‍රතිෂ්ඨාපනය ආදිය මගින් අනන්‍යතාව සුරකිමින් සංස්කෘතික සහජීවනය සහ සාමය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳ ව අධ්‍යයනය කෙරේ.